# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

## 2020 සැප්තැම්බර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වර්ධනය විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**59.8**

**2020 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.9කා ඉහළ යෑමකි.**

2020 අගෝස්තු මාසයට සාපේක්ෂව 2020 සැප්තැම්බර් මාසයේදී නිෂ්පාදන ක්‍රියාකාරකම් ඉහළ වේගයකින් වර්ධනය විය. විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන උප අංශවල, නිෂ්පාදනය සහ නව ඇණවුම් වල සිදුවූ ඉහළ යාම නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ මෙම ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය.

ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ සමහර ප්‍රතිචාර දක්වන්නන්, ව්‍යාපාර කටයුතු යථාවත් වීමත් සමඟ නව ඇණවුම් වැඩි වශයෙන් ලැබීම හේතුවෙන් සිය කර්මාන්තශාලා පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වූ බව අවධාරණය කරන ලදී. තවද මෙම වර්ධනයන්ට සමගාමීව සේවා නියුක්තිය උපදර්ශකයද ඉහළ යන ලදී.

එමෙන්ම, සැප්තැම්බර් මාසයේදී තොග මිලදී ගැනුම් උප දර්ශකයද අඩු වේගයකින් ඉහළ යන ලදී. සෘජු නැව් සේවා හිඟ වීම වැනි සැපයුම්වල සිදුවූ ගැටළු හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි වේගයකින් ඉහළ යන ලදී.


| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **57.9** | **59.8** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 58.5 | 61.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 57.5 | 63.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 54.0 | 51.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 57.5 | 56.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 62.5 | 63.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඇතැම් භාණ්ඩ ආනයනය කිරීම සඳහා බලපැවැත්වෙන සීමාවන් හේතුවෙන් සමහරක් නිෂ්පාදන කටයුතු නිසි ලෙස පවත්වාගෙන යෑමට අපහසු වූ බව සමහර ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.

විශේෂයෙන්ම සමහර කර්මාන්ත කලාපද ඇතුලත්ව රට තුළ දැනට පවත්නා COVID-19 වෛරසය ව්‍යාප්ත වීම හේතුවෙන්, ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන සමස්ත අපේක්ෂාවන්ගේ උප දර්ශකය සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5 කින් ඉහළ යමින් 2020 සැප්තැම්බර් මාසයේදී 52.3ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2020 සැප්තැම්බර් මාසයේදී ඉන්දියාව, එක්සත් ජනපදය සහ යුරෝපා කලාපයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් වැඩි වේගයකින් ඉහළ ගිය අතර, එක්සත් රාජධානිය සහ චීනයේ එම දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, COVID-19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 ඔක්තෝබර් 15 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**සේවා අංශයෙහි වර්ධනයක් අඛණ්ඩව සිව්වන මාසයටත් පෙන්නුම් කරමින්, 2020 සැප්තැම්බර් මාසයේ දී සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව 54.3ක් ලෙස වාර්තා විය.** 2020 අගෝස්තු මාසයට සාපේක්ෂව නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම මෙම වර්ධනය සඳහා දායක වූ අතර, එමගින් සේවා අංශයෙහි ක්‍රියාකාරකම් තව දුරටත් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කෙරේ.


**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**54.3**

**2020 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.7ක පහළ යෑමකි.**

ආර්ථික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමග, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ රක්ෂණ උපඅංශයන්හි නව ව්‍යාපාර 2020 සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියේය.

ව්‍යාපාර ක්‍රියාකාරකම් ද 2020 සැප්තැම්බර් මාසයේ දී අඩු වේගයකින් වර්ධනය විය. කොවිඩ්-19 වසංගතයෙහි අහිතකර බලපෑම්වලට ලක් වූ ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ඉහළ යෑමත් සමග මූල්‍ය සේවා උපඅංශය මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන්ම දායක විය. තවද, 2020 සැප්තැම්බර් මාසයේ දී වැඩි ප්‍රතිනැව්ගත කිරීම් ප්‍රමාණයක් සිදු කිරීමට හැකි වූ බව නැව් භාණ්ඩ හැසිරවීමේ සේවා සපයනු ලබන ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලදී. මීට අමතරව, රක්ෂණ සහ වෘත්තීය සේවා උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් ද 2020 සැප්තැම්බර් මාසයේ දී වර්ධනය විය.




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවා නියුක්තිය අඛණ්ඩව මාස හතක පහළ යෑමකින් අනතුරුව 2020 සැප්තැම්බර් මාසයේ දී සේවා නියුක්ති උපදර්ශකය 50-කඩඉම් මට්ටමට ආසන්න අගයක් වාර්තා කරන ලදී.

ඉල්ලුමෙහි සිදුවන ඉහළ යෑමක් පවත්නා ධාරිතාව තුළ සැපයීමට ඇති හැකියාව පෙන්නුම් කරමින් නිමකිරීමට නියමිත කාර්යයන් උපදර්ශකය තවදුරටත් කඩඉම් මට්ටමට වඩා පහළ අගයක පැවතුණි.

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.0** | **54.3** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 58.3 | 58.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 66.7 | 60.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 38.2 | 49.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.8 | 43.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 70.8 | 59.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, වසරේ දෙවන භාගයේ දී ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබඳ පවත්නා සුභවාදී අදහස් හේතුවෙන් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා 2020 සැප්තැම්බර් මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය. කෙසේ වුව ද, රට තුළ කොවිඩ්-19 වෛරසය නැවත පැතිරීමේ අවදානමක් ඇති වීමත් සමග ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින් ඔවුන්ගේ අපේක්ෂා සාක්ෂාත් කර ගැනීමේ දී ඇතිවිය හැකි ගැටලුකාරී තත්ත්වය පිළිබඳව සඳහන් කරන ලදී.

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

අඛණ්ඩව තෙවන මාසයටත් ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 සැප්තැම්බර් මාසයේ දී 51.6ක් ලෙස වාර්තා වූ අතර, එය මාස හතකින් වාර්තා වූ ඉහළම අගය වන 2020 අගෝස්තු මාසයේ දී වාර්තා වූ 52.0හි සිට සිදු වූ පහළ යෑමකි.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 සැප්තැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානය සහ ඉන්දියාව යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 ඔක්තෝබර් 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.